විභාග අංකය: | DY - | පිටු ගණන: | |

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පරීක්ෂණය - 2021/2022**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2022 මාර්තු)**

# DY 05 - දේශපාලන විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1. ප්‍රශ්න තුනකට පමණක් (03) පිළිතුරු සපයන්න.
2. කාලය පැය දෙකයි (02)
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු එකකින් (01) සමන්විත වේ.
4. සෑම ප්‍රශ්නයකටම සමානව ලකුණු හිමි වේ.
5. පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.
6. ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.
7. පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කර තනි PDF ගොනුවක් සාදන්න.

1. (I) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා බිහිවීමේ සමාජ දේශපාලන පසුබිම පැහැදිලි කරන්න.

   (II) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහාත්මක අන්තර්ගතය පැහැදිලි කරන්න.

2. (I) 1950 – 60 දශකවල දී ශ්‍රී ලංකාව තුළ ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම පිළිබඳ අදහස මතු වූ ආකාරය සාකච්ඡා කරන්න.

   (II) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවාංග මොනවාදැයි පැහැදිලි කරන්න.

3. 1978 ජනාධිපති ආණ්ඩුක්‍රමයෙන් ශ්‍රී ලංකාව තුළ ඇතිකළ විධායකයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඇති විවේචන මොනවාදැයි සාකච්ඡා කරන්න.

4. ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ ක්‍රියාකාරීත්වය සහ එය වර්ධනය වීමේ පසුබිම විශ්ලේෂණය කරන්න.

5. (I) ශ්‍රී ලංකාවේ දෙමළ බෙදුම්වාදී ව්‍යාපාරයේ ඓතිහාසික වර්ධනය පැහැදිලි කරන්න.

   (II) ඊලාම් සන්නද්ධ ව්‍යාපාරයේ වර්ධනය සහ එය බිඳවැටීමට බලපෑ හේතු සාකච්ඡා කරන්න.

6. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑත කාලීන ප්‍රවණතා මොනවාදැයි හඳුන්වන්න.



******

විභාග අංකය: DY - [ ] පිටු ගණන: [ ]

IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - කොළඹ විශ්වවිද්‍යාලය**

**ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පරීක්ෂණය 2022/2021 -**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ මාර්තු 2022)**

## DY 06 - විද්‍යාව හා තාක්ෂණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1. ප්‍රශ්න හතරකට පමණක් (04) පිළිතුරු සැපයිය යුතුයි.
2. කාලය පැය දෙකයි (02)
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු පහකින් (05) සමන්විත වේ.
4. පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.
5. ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.
6. පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කර තනි PDF ගොනුවක් සාදන්න.

1)

a. ගෘහ විද්‍යුත් පරිපථයක ඇති ප්‍රධාන කොටස් අනු පිලිවෙලින් නම් කරන්න.

( ලකුණු 1× 5)

b. ශේෂ ධාරා පරිපථ බිඳිනයක (RCCB ) ක්‍රියා කාරිත්වය සරල රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 8)

c. විද්‍යුත් භූගත කිරීමක් (electrical earthing ) යනු කුමක්දැයි හඳුන්වා දෙන්න.

( ලකුණු 4)

d. භූගත දෝෂයක් සහිත විදුලි උපකරණයක් මගින් පුද්ගලයකු හට විදුලි සැර වදින ආකාරය පහදා නිවැරදි භූගත කිරීමක් මගින් එය මග හරවා ගත හැකි ආකාරය කෙටියෙන් පහදන්න.

( ලකුණු 8)
**(මුළු ලකුණු 25)**

2)

a. විද්‍යුතය සම්බන්ධයෙන් පහත දැක්වෙන පද වල අර්ථය පහදා එහි සම්මත ඒකකය ලියා දක්වන්න.

( ලකුණු 2× 3)

i. විභව අන්තරය (voltage )
ii. ධාරාව (current )
iii. ප්‍රතිරෝධය (resistance )

b. විභව අන්තරය, ධාරාව හා ප්‍රතිරෝධය අතර ඇති සම්බන්ධය කුමක් ද ? එය සමීකරණයක් ආධාරයෙන් ලියා දක්වන්න.

( ලකුණු 2× 2)

c.

i. පහත රූප සටහනේ දක්වා ඇති පරිපථයේ A හා B අතර සමක ප්‍රතිරෝධය ගණනය කරන්න.

( ලකුණු 10)


ii. පරිපථය හරහා ගලන ධාරාව (I) ගණනය කරන්න.

( ලකුණු 3)

iii. සමක ප්‍රතිරෝධය හරහා සිදුවන ශක්ති හානිය ගණනය කරන්න.

( ලකුණු 2)

**(මුළු ලකුණු 25)**





3)

a. යම් වස්තුවක් චලනය වීමට අදාලව එහි වේගය, ප්‍රවේගය හා ත්වරණය අර්ථ දක්වන්න.

(ලකුණු 2×3 )

b. එක්තරා පුද්ගලයකු ගේ ගමනට අදාල ප්‍රවේග-කාල ප්‍රස්ථාරය පහත දැක්වේ. එම පුද්ගලයා ආරම්භයේ සිට අවසානය දක්වා ගමන් ගත් සම්පූර්ණ දුර ගණනය කරන්න.

( ලකුණු 8)





c. යම් වස්තුවක චලනයට අදාලව නිවුටන් ගේ දෙවන නියමය ( Newton's second law ) සඳහන් කර එයට අදාල චලිත සමීකරණය ලියා දක්වන්න.

(ලකුණු 3)

d. පහත රූපයේ ඇති A වස්තුවේ ස්කන්ධය m Kg වන අතර B වස්තුවේ ස්කන්ධය 4 Kg වේ. A හා B පද්ධතිය මත රූපයේ ආකාරයට 45 N බලයක් යොදා සුමට පෘෂ්ඨයක් මත තල්ලු කරනු ලැබේ. පද්ධතිය නිශ්චල තාවයේ සිට 20 ms $^{-1}$ ප්‍රවේගයක් ලබා ගෙනීමට තත්පර 4 ක් ගතවේ නම්, A වස්තුවේ ස්කන්ධය (m) සොයන්න.

( ලකුණු 8)

**(මුළු ලකුණු 25)**



4)

a. උෂ්ණත්වය හා තාපය අතර වෙනස පැහැදිලි කර ඒවායේ සම්මත ඒකක ලියා දක්වන්න.

( ලකුණු 4)

b.

i. ගුප්ත තාපය (latent heat) යනු වෙන් අදහස් කරන්නේ කුමක්ද?

( ලකුණු 4)

ii. පදාර්ථයේ අවස්ථා විපර්යාස යන්හි දී (උදා : අයිස් ජලය බවට පත්වීම) ගුප්ත තාපය එම අවස්ථා විපර්යාසයන්ට සහාගි වන ආකාරය පැහැදිලි කරන්න.

( ලකුණු 3)

c. යම් ලෝහයක 270 g ස්කන්ධයක උෂ්ණත්වය 25 $^0$C සිට 50 $^0$C දක්වා වැඩි කිරීමට 420 J තාප ශක්තියක් අවශ්‍ය වේ. ලෝහයේ විශිෂ්ඨ තාප ධාරිතාව ගණනය කරන්න.

( ලකුණු 5)

d). පහත දැක්වෙන සිදුවීම් වලට විද්‍යාත්මක හේතු පැහැදිලි කරන්න

i. රේල් පීලි දෙකක් එකට සම්බන්ධ කිරීමේදී එකිනෙක හා සම්මුක රේල් පීලි යම් ඉඩ ප්‍රමාණයක් තබා සම්බන්ධ කිරීම.

( ලකුණු 4)

ii. ජලය පිරි ලිඳක පතුල ඉස්සී ඇති සේ (ගැඹුර අඩුවී ) දිස්වීම.

( ලකුණු 5)

**(මුළු ලකුණු 25)**

5)

a. අප වට ඇති වායු ගෝලය අධ්‍යනය කිරීමේ පහසුව සඳහා උප ගෝල කිහිපයකට බෙදා දක්වා ඇත.

i. මෙම බෙදා දැක්වීම සිදුකර ඇත්තේ කුමන පදනමක් යටතේද ?

(ලකුණු 4 )

ii. වායු ගෝලය සමන්විත වන උපගෝල පහ මොනවාදැයි නම් කරන්න.

(ලකුණු 5 )

b. හරිතාගාර ආවරණය (green house effect ) පෘථිවියෙහි ජීවයේ පැවැත්මට ඉතා වැදගත් කාර්යයක් සිදුකරයි. හරිතාගාර ආවරණ ක්‍රියා වලිය පැහැදිලි කර එය ජීවයේ පැවැත්මට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 6)

c. ඔසෝන් ස්තරය මගින් UV කිරණ අවශෝෂණය කරගන්නා ආකාරය පැහැදිලි කර ඔසෝන් ස්තරය ක්ෂය වීම නිසා ඇති වන බලපෑම් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 6 )

d. හරිතාගාර ආවරණය ස්වාභාවික සන්සිධියක් උවද, මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙ මගින් ගෝලීය උෂ්ණත්වය ඉහල යාමට ඉවහල් වේ. මෙය පහදා දෙන්න.

(ලකුණු 4)

**(මුළු ලකුණු 25)**



*****************

විභාග අංකය: DY -

පිටු ගණන:

IHRA UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පරීක්ෂණය - 2021/2022

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2022 මාර්තු)

# DY 07 - ව්‍යාපාර පරිසරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1. ප්‍රශ්න හතරකට පමණක් (04) පිළිතුරු සපයන්න.
2. කාලය පැය දෙකයි (02)
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.
4. පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.
5. ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.
6. පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කර තනි PDF ගොනුවක් සාදන්න.

1. (i) ව්‍යාපාර පරිසරය (Business Environment) ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 08)

(ii) ඒ ඒ ව්‍යාපාරයට අදාළ නීතිමය බලපෑම වෙනස්ය. උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 08)

(iii) රටක ව්‍යාපාර පද්ධතිය පුළුල් වීම කෙරෙහි කුමන කරුණු බලපාන්නේදැයි පහදන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 25)

2. (i) "ව්‍යවසායකයා" (Entrepreneur) ලෙස ඔබ අදහස් කරන්නේ කෙබඳු අයෙක්ද? පහදන්න.

(ලකුණු 08)

(ii) "ව්‍යවසායකයා" හා "ව්‍යාපාරිකයා" අතර ඔබ දකින වෙනස්කම් මොනවාද?

(ලකුණු 08)

(iii) රටක සංවර්ධනයට ව්‍යවසායකගේ දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 09)
(මුළු ලකුණු 25)

3. (i) වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන ඩොලර් හිඟයට විසඳුම් ලෙස ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ii) ආනයන පරිමාව හා අපනයන පරිමාව (Import & Export Volume) අතර ඇති සෘණ පරතරය සම්බන්ධයෙන් විසඳුම් ලෙස ඔබගේ අදහස් මොනවාද?

(ලකුණු 08)

(ii) ගෝලීය වශයෙන් ඇතිවන අර්බුදයකට මුහුණදීම සඳහා රටක ප්‍රතිපත්තිය කෙබඳු විය යුතුද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 25)

4. (i) ව්‍යාපාර සම්බන්ධයෙන් "තොග පාලනය" (Inventory control) යන්නෙහි අදහස කුමක්ද?

(ලකුණු 08)

(ii) ගබඩාවක ඇති තොග මට්ටම් සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) ගබඩාවකට තොග ඇණවුම් කළ යුත්තේ කුමන අවස්ථාවකදීද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 25)

5. "ව්‍යාපාර ක්ෂේත්‍රයට සෘජු ලෙස සම්බන්ධ වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයයි." (Finance Field)

(i) ව්‍යාපාර හා මූල්‍ය ක්ෂේත්‍රය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(ii) ව්‍යාපාර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය මඟින් ඇතිකරන බලපෑම කෙබඳුද?

(ලකුණු 08)

(iii) "ඕනෑම බැංකුවක් මූල්‍යායතනයක් වන අතර ඕනෑම මූල්‍යායතනයක් බැංකුවක් නොවේ." පහදන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 25)

6. කෙටි සටහන් ලියන්න.

(i) සන්නිවේදනය

(ii) රක්ෂණය

(iii) මහජන සම්බන්ධතාව

(iv) ප්‍රවාහනය

(v) විගණනය

(ලකුණු 5x5 = 25 )



*******

විභාග අංකය: | DY - | පිටු ගණන: | |

**IHRA**
**UNIVERSITY OF COLOMBO**

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පරීක්ෂණය - 2021/2022**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2022 මාර්තු)**

# DY 08 - ශ්‍රම අධ්‍යාපන මූලධර්ම

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1. ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
2. කාලය පැය දෙකයි (02)
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු එකකින් (01) සමන්විත වේ.
4. පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.
5. ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.
6. පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.
7. අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු නොලැබේ.

1. "ශ්‍රී ලංකාවේ ශ්‍රම සහභාගීත්වය වෙනත් දියුණු රටවල් හා සැසඳීමේදී අඩු මට්ටමක පවතී."
මෙසේ අඩු මට්ටමක පැවතීමට බලපාන්නාවූ හේතු දක්වන්න.

(ලකුණු 20)

2. ශ්‍රම බලකායක ගුණාත්මකභාවය නැංවීමට ඔබ විසින් යෝජනා කරනු ලබන කරුණු දක්වා එමඟින් රටක ආර්ථිකයකට ලබන්නාවූ පිටුවහල විස්තර කරන්න.

(ලකුණු 20)

3. (i) " ශ්‍රමය සමජාතී නොවේ."
ශ්‍රමය වෙනස්වීමට බලපාන්නාවූ සාධක දක්වන්න.

(ලකුණු 10)

(ii) දියුණු වන රටවල් හා දියුණු රටවල් ශ්‍රමය තම නිෂ්පාදන කාර්යයන්හි යොදා ගැනීමේදී හා ඵලදායීත්වය නංවාලීමේදී දක්නට හැකි වෙනස්කම් දක්වන්න.

(ලකුණු 10)

4. (i) 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත මඟින් කාර්මික ආරවුල් විසඳීම සඳහා දක්වා ඇති ප්‍රතිපාදන සඳහන් කරන්න.

(ලකුණු 10)

(ii) ඉහත සඳහන් ප්‍රතිපාදන අතරින් දෙකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

5. (i) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) වර්ථමානයට ගැලපෙන පරිදි මෙය සකස්විය යුතු ආකාරය පිළිබඳව ඔබේ යෝජනා දක්වන්න.

(ලකුණු 10)

6. පහත සඳහන් කරුණු අතරින් හතරකට (4) කෙටි සටහන් ලියන්න.
(i) ශ්‍රම විභජනය.
(ii) සාමුහික ගිවිසුම්.
(iii) පඩි පාලක සභා.
(iv) 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත.
(v) ඌණ සේවා නියුක්තිය.

(ලකුණු 5 බැගින්)
(ලකුණු 20)



*********